## 8. 2. 9. 3

## කිංමූලක සුත්තං

[සාවත්ථිනිදානං]

සචෙ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කිංමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා, කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා; කිංආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිංසාරා සබ්බෙ ධම්මාති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං කින්ති බ්‍යාකරෙය්‍යාථාති?.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා භගවන්නෙත්තිකා භගවං පටිසරණා. සාධු භන්තෙ, භගවන්තං යෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී ති.

තෙන හි භික්ඛවෙ, සුණාථ[1] සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සචෙ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කිංමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා, කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා, කිංආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිං සාරා සබ්බෙ ධම්මාති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ:

ඡන්දමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, මනසිකාරසම්භවා සබ්බෙ ධම්මා, ඵස්සසමුදයා සබ්බෙ ධම්මා, වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා, සමාධිපමුඛා සබ්බෙ ධම්මා, සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා, විමුත්තිසාරා සබ්බෙ ධම්මා'ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථාති.

---

1. දෙසෙස්සාමි. තං සුණාථ - මජසං



Free Distribution www.aathaapi.org

## 8. 2. 9. 3

## කිංමූලක සූත්‍රය

**[සැවැත්නිදන යි]**

ඉදින් මහණෙනි, අන් තොටු පිරිවැජියෝ මෙසේ පුළුවුස්නාහු ද: ඇවැත්නි, හැම දහම්හු (පඤ්චස්කන්ධයෝ) කුමක් මුල්කොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් ප්‍රභවකොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් සමුදයකොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් වැදගැනුම් කොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ආධිපත්‍යය කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් උතුරු කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් හරකොට ඇත්තාහු ද? කියායි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි අන්තොටු පිරිවැජියනට කුමැයි පවසවු ද?

වහන්ස, අපගේ ධර්මයෝ භගවත්හු මුල්කොට ඇත්තාහ. භගවත්හු නෙතෘකොට ඇත්තාහ. භගවත්හු පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා! භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා භික්ෂූහු ධරත්යි.

එසේ නම් මහණෙනි, අසවු, මොනොවට මෙනෙහි කරවු, කියමි යි. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක:

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, හැම දහම්හු කුමක් මුල්කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් සමුදය කොට ඇත්තාහුද, හැම දහම්හු කුමක් වැදගැනුම කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ආධිපත්‍යය කොට ඇත්තාහුද, හැම දහම්හු කුමක් උතුරුකොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් හරකොට ඇත්තාහු දයි මෙසේ පුළුවුස්නාහු නම් මහණෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසවු.

ඇවැත්නි, හැම දහම්හු ඡන්දය (අධ්‍යාශයඡන්දය, කත්තුකම්‍යතා ඡන්දය) මුල්කොට ඇත්තාහ, හැම දහම්හු මනසිකාරය ප්‍රභවකොට ඇත්තාහ, හැම දහම්හු ස්පර්ශය සමුදය කොට ඇත්තාහ, හැම දහම්හු වෙදනාව වැදගැනුම කොට ඇත්තාහ, හැම දහම්හු සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහ, හැමදහම්හු ස්මෘතිය ආධිපත්‍යය කොට ඇත්තාහ, හැම දහම්හු ප්‍රඥව උතුරු කොට ඇත්තාහ, හැම දහම්හු විමුක්තිය සාරකොට ඇත්තාහ යි. මහණෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසවු යි.